# සංක්ෂිප්තය

යම් රටක ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම්කරණයන්, අධ්‍යාපන ක්‍රියාවලියෙහි වැදගත් ම ආයතනය වන ''පාසල'' නම් වූ සංවිධානයෙහි ක්‍රියාත්මකවීමේ ස්වභාවය මත එහි සාර්ථකත්වය පිළිබඳ ප්‍රබල අදහසක් ලබා ගත හැකිවෙයි. නමුත් ප්‍රමාණාත්මකව වර්ධනය වන අධ්‍යාපන ඉඩප්‍රස්ථාවන් ගුණාත්මක ව්‍යුහයක් තුළ සංවර්ධනය නොවීම තවමත් අධ්‍යාපන පද්ධතියෙහි නොවිසඳුණු ගැටලුවක් බවට පත්ව ඇත. මෙම ප්‍රමාණාත්මක අධ්‍යාපන තත්වයන් ගුණාත්මක වශයෙන් ඉහළ ප්‍රවේශයක සිට ක්‍රියාත්මක කිරීමෙන් අධ්‍යාපන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට ඇති හැකියාව පිළිබඳ වර්තමානයේ පෘථුල අවධානයක් යොමු කිරීම අතිශය වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියෙහි ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ, පාසල් සංස්ථාවෙහි පවතින පොදු කළමනාකරණය විධිමත් නොවීමයි. එය මනාව හඳුනා ගනිමින් සුදුසු විසඳුම් යෝජනා කිරීම මෙරට අධ්‍යාපන පර්යේෂකයන් හමුවේ ඇති ප්‍රධාන අභියෝගයකි.

මේ අනුව අධ්‍යාපන පද්ධතියෙහි වැදගත් ම ආයතනය වන ''පාසල'' පදනම් කර ගනිමින් උපකෘත විශේෂ පාසල්හි මානව සම්පත් කළමනාකරණයෙහි ස්වභාවය හා එය වඩාත් ඵලදායි කර ගැනීම සඳහා අනුගමනය කෙරෙන නව ප්‍රවණතා පිළිබඳ මෙම පර්යේෂණය සිදුකර ඇත. අධ්‍යාපන කළමනාකරණය හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අවධානය යොමුකරමින්, උපකෘත විශේෂ පාසල්හි මානව සම්පත් කළමනාකරණය විශේෂ අවධානයට ලක්කරමින්, මේ පිළිබඳ විධිමත් අධ්‍යයනයක් සිදු කිරීමෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට ඵලදායි මෙහෙවරක් ඉටුකිරීමට පර්යේෂකයා උත්සාහ දරා තිබේ.

මෙම අධ්‍යයනය මගින් උපකෘත විශේෂ පාසල්හි මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලිය පර්යේෂණයට ලක් කර එය වඩාත් ඵලදායි කර ගැනීමට උපයෝගී කර ගැනෙන නව ප්‍රවණතා ඉදිරිපත් කිරීම සිදු කරයි.

සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ ක්‍රම හා ලේඛන භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත උපකෘත විශේෂ පාසල් දහයක් ඇසුරින් පාසල් කළමනාකරුවන්, විදුහල්පතිවරුන්, අංශභාර ගුරුවරුන්, ගුරුවරුන් හා ශිෂ්‍යයින් හතළිහක සමස්ත නියැදියක් යොදා ගනිමින් විස්තරාත්මක අධ්‍යයනයක් ලෙස බහුවිධ ක්‍රම මගින් අදාළ දත්ත රැස්කිරීම සිදු විය.

මෙම දත්ත විශ්ලේෂණයේ දී පාසල්හි මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විධිමත් කාර්යයන් පැවරීමක් හෝ අවබෝධයක් නොමැති බව අනාවරණය වූ අතර ඒ සඳහා දැනුවත්වීමේ ප්‍රබල අවශ්‍යතාවයක් පවතින බව ද තහවුරු විය. ඒ අනුව මේ සඳහා ක්‍රමවත් අධීක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමත්, තම භූමිකා සකස් කරගැනීම පිළිබඳ උපකෘත පාසල් පරිපාලනයට ප්‍රමාණවත් දැනුමක් ලබාදීමටත් යෝජනා කෙරේ. එසේම මෙම පාසල්හි ක්‍රියාත්මක කළමනාකරණ මණ්ඩලය තවදුරටත් බලවත්ත කිරීම, විදුහල්පති කළමනාකරුවකු වශයෙන් සහභාගිත්ව කළමනාකරණයට නැඹුරුවීම, පාසල් ගුරු සංවර්ධනය විධිමත් කිරීම කෙරෙහි ද මෙම අධ්‍යයනයෙන් පර්යේෂකයා අවධානයට ලක් කරයි.

ඒ අනුව තවදුරටත් මෙම පාසල් සම්බන්ධ අධ්‍යයනයන් සිදු කර ඵලදායි මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වා ගැනීමට අවශ්‍ය පර්යේෂණ අනාවරණයන් ඉදිරිපත් කිරීම වඩා වැදගත් මෙන් ම අත්‍යවශ්‍ය කාර්යයක් ද වේ.

# ABSTRACT

A solid view on the success of education policies and planning implemented in a country can be produced based on the nature of operations in the organization called 'school' which is the focal point of the system of education. Day by day, opportunities for education are increased quantitatively. However, the non-development of such opportunities within a qualitative structure has become a problem unsolved up-to-the date. Henceforth, it is indispensable to pay a great attention towards possibilities of achieving the objectives of education by implementing so called quantitative education standards at a higher level of qualitative approach.

One of the major problems prevailing in the education system of Sri Lanka is that the non-regularization of general management of the school. The proper identification of the nature of that problem and proposing of possible solutions is a main challenge faced by the educational researchers of our country.

Accordingly, this research has been conducted based on the 'school' which is of vital importance in the education system and thereby paying attention on the nature of human resource management in Assisted Special Schools and new trends followed to make it more effective. By carrying out a formal study on human resource management in Assisted Special Schools, the researcher has taken an effort to fulfill a great responsibility and to provide a pronounced contribution towards the qualitative development of education in Sri Lanka while paying attention on the Education Management and Human Resource Management.

Through this study, the process of human resource management in Assisted Special Schools has been subjected to research and thereby, new trends which can be followed to make that process more effective are presented.

The sample consists of School Managers, Principals, Sectional Heads, Class – Teachers and Students from Ten Assisted Special Schools approved by the Ministry of Education in Sri Lanka and this Research was implemented as a descriptive study operated with multiple research mechanisms.

The analysis of data revealed that no formal assignment of duties or proper understanding related to human resource management was there in those schools and it was firmly witnessed and proved that there was a dire necessity in making them aware on the matter. It is proposed to implement a regular and formal system of supervision and to provide the administration authorities of Assisted Schools with a proper guidance and awareness on shaping up their roles as well as responsibilities. Through this study, the researcher pays the attention on further empowerment of Management Boards operating in these schools, practicing the participatory management approach by the principal as a manager and regularization of teacher development process of the school, as well.

As such, conducting further studies on these Assisted Special Schools and presentation of such research findings, which are required to continue with an effective human resource management process in these schools, are of vital importance and indispensable.